# දළ ජාතික නිෂ්පාදිතය – ආදායම හා වියදම

**සමස්ත උපනතීන්**

1987 දී ශ්‍රී ලංකාවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 1986 වර්ෂයේදී පැවති සියයට 4.3 ක වර්ධන වේගය හා සැසඳීමේදී සියයට 1.5 කින් වැඩි වී ඇති බව ඇස්තමේන්තු කර ඇත. 1987 වර්ෂයේ පැවති අයහපත් කාලගුණික තත්ත්වය ශ්‍රී ලංකා ආර්ථිකයේ වැදගත් ස්ථානයක් දරන කෘෂිකාර්මික අංශයේ ක්‍රියාකාරිත්වය දුර්වලවීමට ප්‍රධාන වශයෙන් හේතුවිය. දිගු කලක් තුළ පැවති නියඟය, පොල් හා වී නිෂ්පාදනය කෙරේ අහිතකර අන්දමින් බලපෑ බව පෙනී ගිය කරුණකි. පෙර වසර හා සසඳන කල නිමැවුම් කර්මාන්ත අංශය තුළ අඩු වර්ධන වේගයක් දක්නට ලැබුනද සැළකිය යුතු වර්ධන ක්‍රියාවලියක් පවත්වා ගෙන යාමට හැකිවී ඇත. තැනීම් කටයුතු සහ පතල් හා කැනීම් අංශවල ඉහළ වර්ධන අනුපාතිකයක් වාර්තා වී ඇති අතර, සේවා අංශය පුළුල් වී ඇත්තේ සාපේක්ෂ වශයෙන් අඩු අනුපාතිකයකිනි.

පවත්නා සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය 1987 දී රුපියල් දශ ලක්ෂ 173,395 ක් වූ අතර එය 1986 වර්ෂයට වඩා සියයට 8.5 ක වැඩිවීමකි. ආර්ථිකයේ සමස්ත මිළ වෙනස්වීම පෙන්නුම් කරන දළ ජාතික නිෂ්පාදිත අවධමනකය 1987 දී සියයට 6.8 කින් ඉහළ ගිය අතර පෙර වසරේදී වැඩි වූයේ සියයට 5.5 කිනි.

1987 දී ශ්‍රී ලංකාවේ මැදි වසර ජනගහණය දශ ලක්ෂ 16.361 ක් වශයෙන් තාවකාලික ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය 1986 වසරට වඩා සියයට 1.5 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. ඒ අනුව ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය පවත්නා සාධක මිළ අනුව රුපියල් 10,598 (ඇ. එ. ජ. ඩො. 360) ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර මූර්ත වශයෙන්, පෙර වසරේ ඒක පුද්ගල ආදායමේ සියයට 2.7 වර්ධන වේගය හා සසඳන කල 1987 දී සියයට 0.1 ක ආන්තික වැඩිවීමක් සිදු වී ඇතැයිද ඇස්තමේන්තු කර ඇත. වෙළෙඳ අනුපාතිකයෙහි වූ බලපෑම් හා ගැලපීමෙන් පසු, මූර්ත ජාතික ආදායම පෙර වර්ෂයේ වූ සියයට 3.1 ක වර්ධනය හා සැසඳීමේදී 1987 වර්ෂයේ සියයට 2.1 ක වැඩිවීමක් දක්නට ඇත.

**ආංශිය ක්‍රියාකාරිත්වය**

දළ ජාතික නිෂ්පාදිතයේ ආංශිය සංයුතිය හා ස්ථාවර මිළ ගණන් අනුව එකතු කළ අගයේ වෙනස්වීම් අංක 1.2 දරණ සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1987 වර්ෂයේ කෘෂිකර්ම, වන හා ධීවර අංශයේ සියයට 5.8 ක අඩුවීමක් වාර්තා වී ඇත. ප්‍රධාන වගාවන් දෙකක් වූ වී හා පොල් වගාවල නිෂ්පාදන මට්ටම අඩුවීම මෙයට ප්‍රධානතම හේතුව විය. එසේ වුවද, වන හා ධීවර අංශවල එකතු කළ වටිනාකම පිළිවෙලින් සියයට 13 කින් හා සියයට 4 කින් වැඩි වූ අතර කෘෂිකාර්මික අංශයෙහි එකතු කළ වටිනාකම සියයට 8 කින් පහත වැටිණි. වැවිලි කර්මාන්ත අංශයේ තේ නිෂ්පාදනය සියයට 1 කින් වැඩි වූ අතර රබර් නිෂ්පාදනය සියයට 11 කින්ද, පොල් නිෂ්පාදනය සියයට 25 කින්ද පහත වැටිනි. ආහාර භෝග උප අංශයේ වී නිෂ්පාදනයද සියයට 18 කින් පහත වැටිණි.

මැණික් කර්මාන්තය පුළුල් වීම නිසා පතල් හා කැණීම් අංශයේ නිෂ්පාදනය 1987 දී සියයට 19 කින් වැඩි විය. මෙය අපනයනය වැඩිවීමෙන් වඩාත් තහවුරු වෙයි. පෙර වසරට වඩා 1987 දී මැණික් අපනයනයේ වි. ගැ. හි. අනුව වටිනාකම සියයට 65 කින් වැඩි වී ඇත.

1987 දී නිමැවුම් කර්මාන්ත අංශයේ සමස්ත වර්ධනය සියයට 7 ක් ලෙස වාර්තා වී ඇත. මෙයට ප්‍රධාන හේතුව වූයේ රජය සතු කර්මාන්තවල නිෂ්පාදනය සියයට 3 කින් පහත වැටී තිබියදී වුවද, කර්මාන්ත නිෂ්පාදනවල සියයට 8.3 ක වර්ධනයක් ඇතිවීමයි. ඉකුත් වර්ෂවල පැවති වර්ධන රටාව හා අනුකූලව යමින් 1987 වර්ෂයේද රෙදිපිළි, ඇඟලුම් හා සම් භාණ්ඩ නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ සියයට 37 ක ඉහළ වර්ධනයක් වාර්තා විය. අපනයන කෘෂි සැකසුම් කර්මාන්තවල සියයට 4 ක ප්‍රසාරණයක් ඇති විය. අසුරන ලද තේ අපනයනය සියයට 15 කින් වැඩිවීම මෙම වර්ධනයට දායක වූ ප්‍රධානතම සාධකය විය. තවද මෙම අපනයන වටිනාකම ශ්‍රී ලංකාවේ මුළු තේ අපනයන වටිනාකමින් සියයට 40 ක ප්‍රමාණයක් බවට පත්ව ඇත. කර්මාන්ත නිෂ්පාදන උප අංශයේ, පෞද්ගලික අංශයේ කර්මාන්තවල, එකතු කළ වටිනාකම පෙර වර්ෂයේ සියයට 15 ක වර්ධනය හා සැසඳීමේදී 1987 වර්ෂයේ සියයට 13 ක වර්ධනයක් දක්නට ඇත.

## 1 . 6 සංඛ්‍යා සටහන

### ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ආංශීය සංයුතිය සහ වර්ධනය 1985 – 1987

| අංශය | වටිනාකම (රු. දශ ලක්ෂ) | | | ද. ජා. නි. හි ප්‍රතිශතයක් වශයෙන් | | | පසුගිය වසරට වඩා වැඩිවීම (රු. දශ ලක්ෂ) | | ද. ජා. නි. වැඩිවීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1985 | 1986* | 1987* | 1985 | 1986 | 1987 | 1986 | 1987 | 1986 | 1987 |
| 1. කෘෂිකර්මය, දුව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය .. | 28,366 | 29,106 | 27,409 | 26·6 | 26·1 | 24·2 | 740 | – 1,697 | 15·3 | – 97·4 |
| 1·1 කෘෂිකර්මය .. | 24,504 | 25,037 | 23,003 | 23·0 | 22·4 | 20·3 | 533 | – 2,034 | 11·0 | – 116·8 |
| 1·1·1 තේ .. | 2,759 | 2,723 | 2,750 | 2·6 | 2·4 | 2·4 | – 36 | 27 | – 0·7 | 1·5 |
| 1·1·2 රබර් .. | 851 | 856 | 765 | 0·8 | 0·8 | 0·7 | 5 | – 91 | 0·1 | – 5·2 |
| 1·1·3 පොල් .. | 3,828 | 3,935 | 2,967 | 3·6 | 3·5 | 2·6 | 107 | – 968 | 2·2 | – 55·6 |
| 1·1·4 වී .. | 6,783 | 6,613 | 5,423 | 6·4 | 5·9 | 4·8 | – 170 | – 1,190 | – 3·5 | – 68·3 |
| 1·1·5 අනෙකුත් .. | 10,283 | 10,910 | 11,098 | 9·6 | 9·8 | 9·8 | 627 | 188 | 13·0 | 10·8 |
| 1·2 දුව ආදී වන ද්‍රව්‍ය .. | 1,923 | 1,958 | 2,215 | 1·8 | 1·8 | 2·0 | 35 | 257 | 0·7 | 14·8 |
| 1·3 ධීවර .. | 1,939 | 2,111 | 2,191 | 1·8 | 1·9 | 1·9 | 172 | 80 | 3·6 | 4·6 |
| 2. පතල් හා කැනීම් කටයුතු .. | 2,486 | 2,615 | 3,112 | 2·3 | 2·3 | 2·8 | 129 | 497 | 2·7 | 28·5 |
| 3. නිමැවුම් කර්මාන්ත .. | 16,193 | 17,558 | 18,748 | 15·1 | 15·7 | 16·5 | 1,365 | 1,190 | 28·3 | 68·3 |
| 3·1 අපනයන සැකසීම .. | 3,222 | 3,225 | 3,340 | 3·0 | 2·9 | 2·9 | 3 | 115 | 0·1 | 6·6 |
| 3·2 නිෂ්පාදන කර්මාන්ත .. | 10,811 | 12,108 | 13,113 | 10·1 | 10·8 | 11·6 | 1,297 | 1,005 | 26·9 | 57·7 |
| 3·3 කුඩා සහ අනෙකුත් කර්මාන්ත .. | 2,160 | 2,225 | 2,295 | 2·0 | 2·0 | 2·0 | 65 | 70 | 1·3 | 4·0 |
| 4. තැනීම් .. | 8,070 | 8,191 | 8,338 | 7·6 | 7·3 | 7·4 | 121 | 147 | 2·5 | 8·4 |
| 5. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා .. | 1,313 | 1,406 | 1,448 | 1·2 | 1·3 | 1·3 | 93 | 42 | 1·9 | 2·4 |
| 6. ප්‍රවාහනය, ගබඩා කිරීම සහ පණිවුඩ හුවමාරුව | 12,959 | 13,377 | 13,538 | 12·1 | 12·0 | 11·9 | 418 | 161 | 8·7 | 9·2 |
| 7. තොග සහ සිල්ලර වෙළඳාම .. | 22,925 | 23,821 | 24,496 | 21·5 | 21·4 | 21·6 | 896 | 675 | 18·6 | 38·8 |
| 8. බැංකු, රක්ෂණය සහ නිශ්චල දේපළ .. | 4,975 | 5,174 | 5,490 | 4·7 | 4·6 | 4·8 | 199 | 316 | 4·1 | 18·2 |
| 9. නිවාස අයිතිය .. | 3,432 | 3,497 | 3,550 | 3·2 | 3·1 | 3·1 | 65 | 53 | 1·3 | 3·1 |
| 10. රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක කටයුතු .. | 4,432 | 5,274 | 5,435 | 4·2 | 4·7 | 4·8 | 842 | 161 | 17·5 | 9·2 |
| 11. සේවා (අන් තැනෙක සඳහන් නොවන) . | 4,419 | 4,242 | 4,358 | 4·2 | 3·8 | 3·9 | – 177 | 116 | – 3·7 | 6·7 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය .. | 109,570 | 114,261 | 115,922 | 102·7 | 102·4 | 102·3 | 4,691 | 1,661 | 97·2 | 95·4 |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදයම .. | – 2,829 | – 2,696 | – 2,615 | – 2·7 | – 2·4 | – 2·3 | 133 | 81 | 2·8 | 4·6 |
| 14. දළ ජාතික නිෂ්පාදිතය .. | 106,741 | 111,565 | 113,307 | 100·0 | 100·0 | 100·0 | 4,824 | 1,742 | 100·0 | 100·0 |

* තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

තැනීම් කටයුතු අංශයේ වර්ධනය පෙර වසරේ සියයට 1.5 හා සැසඳීමේදී 1987 වසරේ සියයට 1.8 කින් පුළුල් වී ඇත. 1986 වසරේදී සියයට 4.3 ක් වූ වර්ධනය හා සැසඳීමේදී සේවා අංශය 1987 දී සියයට 2.7 ක වැඩි වීමක් පෙන්නුම් කෙරේ. සේවා අංශයට ඇතුළත් වන බැංකු කටයුතු, රක්ෂණ හා නිශ්චල දේපළ සහ අනෙකුත් සේවාවල ඉහළ වර්ධන අනුපාතයන් වාර්තා විය. බැංකු අංශයේ, උපයන ලද ලාභ වැඩිවීම නිසා 1986 සියයට 4 ක වර්ධනය හා සැසඳීමේදී 1987 වර්ෂයේ මූල්‍ය හා සේවා අංශයෙහි සියයට 6 ක වර්ධනයක් සටහන් විය.

කෘෂිකාර්මික අංශයේ අඩු නිෂ්පාදන මට්ටම නිසා වෙළෙඳ ද්‍රව්‍ය ගබඩාකරණය පහත වැටීම හා ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත්වල ඇතිවූ බාධාකාරී වාතාවරණය ප්‍රවාහන කටයුතු කෙරෙහි බලපෑමත්, ප්‍රවාහනය, ගබඩා කිරීම් හා පණිවුඩ හුවමාරු යන අංශයේ වර්ධනය අඩාලවීමට හේතුවිය. 1986 වර්ෂයේ වූ සියයට 3.9 ක වර්ධනය හා සසඳන කල තොග සහ සිල්ලර වෙළෙඳාමේ එකතු කළ අගය 1987 දී සියයට 2.8 කින් ඉහළ නැගිණි. ආනයන වෙළෙඳාම සියයට 1.7 කින් ප්‍රසාරණය වූ අතර, අපනයන වෙළෙඳාම වැඩි වූයේ ආන්තික වශයෙනි. 1987 දී ජල විදුලිබල උත්පාදන ජලාශවල ජල මට්ටම පහත වැටීම නිසා ජල විදුලිබල උත්පාදනය සියයට 18 කින් අඩුවූ අතර එම අඩුවීම මුළු විදුලිබල උත්පාදනය සියයට 2 ක වර්ධනයකට සීමාකිරීමට සාධකයක් වූවා මෙන්ම විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා අංශයේ වර්ධනය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතුවිය.

1986 වර්ෂයේ සියයට 19 ක් වූ වර්ධනය සමඟ සැසඳීමේදී රාජ්‍ය පරිපාලන සහ ආරක්ෂක සේවාවන්හි එකතු කළ අගය 1987 වර්ෂයේදී සියයට 3 කින් වැඩි විය.

**වියදම් රටාව**

පවත්නා වෙළෙඳ මිළ යටතේ දළ දේශීය වියදම 1987 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 217,387 ක් විය. මෙය පෙර වර්ෂයට වඩා සියයට 8.5 ක වැඩිවීමකි. 1987 මුළු පරිභෝජන වියදම රුපියල් දශ ලක්ෂ 171,487 ක් වූ අතර එය පෙර වසරට වඩා සියයට 8.6 ක වැඩිවීමකි. රජයේ පරිභෝජන වියදම සියයට 6 කින් වැඩි වූ අතර පෞද්ගලික පරිභෝජනය සියයට 9 කින් ඉහළ ගියේය.

**1 . 7 සංඛ්‍යා සටහන**

**ප්‍රාග්ධන වියදමෙහි ආනයනිත ප්‍රමාණය 1985 – 1987**

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1985 | 1986* | 1987* |
|---|---|---|---|
| 1. දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 38,457 | 42,326 | 45,752 |
| 2. ආනයනිත ආයෝජන භාණ්ඩ (මි.ර.ගැ. වටිනාකම) .. | 9,488 | 9,649 | 10,623 |
| 3. නැව් සහ ගුවන් යානා හැර ආනයනිත ආයෝජන භාණ්ඩ .. (මි.ර.ගැ. වටිනාකම) | 7,877 | 9,649 | 10,623 |
| 4. ආනයනිත ප්‍රමාණය (අංක 2, අංක 1 හී ප්‍රතිශතයක් ලෙස) .. | 24·7 | 22·8 | 23·2 |

* තාවකාලිකයි

මූලය : ශ්‍රී ලංකා රේගුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

පෙර වසරේ සියයට 9.8 ක වැඩිවීමක් වාර්තා වී ඇති, පවත්නා මිළ යටතේ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය (තොග වෙනස්වීම් ද ඇතුළත්ව) 1987 දී සියයට 8 කින් වැඩි වී ඇත. 1987 දී පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ඒකාබද්ධ ප්‍රාග්ධන සම්පාදනය සියයට 5.6 කින් ඉහළ ගොස් ඇති අතර, 1986 හා සැසඳීමේදී වැඩිවීම සියයට 6.4 ක් විය. 1986 දී සියයට 23 ක පුළුල් වීම හා සැසඳීමේදී මධ්‍යම ආණ්ඩුවේ හා පළාත් පාලන ආයතනයන්හි දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 1987 දී පුළුල් වී ඇත්තේ සියයට 17 කිනි.

# 1.8 සංඛ්‍යා සටහන

## සම්පත් සංයුතිය හා උපයෝගී කරගත් ආකාරය 1978 – 1987

| ශීර්ෂය | වර්තන වෙළෙඳ මිළ අනුව (රු. දශ ලක්ෂ) | | | | 1978 මිළ අනුව | | | | | | | | ප්‍රතිශතක වර්ධනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 1978 | | 1985 | | 1986* | | 1987* | | | |
| | 1978 | 1985 | 1986* | 1987* | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | 1985 ට වඩා 1986 | 1986 ට වඩා 1987 |
| 1. මුළු සම්පත් .. | 59,537 | 224,021 | 242,881 | 266,946 | 59,537 | 100 | 85,809 | 100 | 90,712 | 100 | 91,192 | 100 | 5·7 | 0·5 |
| 1·1 වෙළෙඳ මිළ අනුව ද.දේ.නි. .. | 42,665 | 162,375 | 179,474 | 196,723 | 42,665 | 72 | 61,852 | 72 | 64,512 | 71 | 65,480 | 72 | 4·3 | 1·5 |
| 1·2 භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන .. | 16,872 | 61,646 | 63,407 | 70,223 | 16,872 | 28 | 23,957 | 28 | 26,200 | 29 | 25,712 | 28 | 9·4 | – 1·9 |
| 2. උපයෝගීකරණය .. | 59,537 | 224,021 | 242,881 | 266,946 | 59,537 | 100 | 85,809 | 100 | 90,712 | 100 | 91,192 | 100 | 5·7 | 0·5 |
| 2·1 පරිභෝජනය .. | 36,148 | 143,102 | 157,850 | 171,487 | 36,148 | 61 | 53,091 | 62 | 54,206 | 59 | 54,659 | 60 | 2·1 | 0·8 |
| 2·2 ස්ථාවර දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය .. | 8,521 | 38,457 | 42,326 | 45,752 | 8,521 | 14 | 13,688 | 16 | 15,040 | 17 | 14,976 | 16 | 9·9 | – 0·4 |
| 2·2·1 රජය .. | (3,077) | (7,767) | (9,634) | (11,216) | (3,077) | (5) | (3,963) | (5) | (4,479) | (5) | (4,299) | (4) | 13·0 | – 4·0 |
| 2·2·2 රජයේ සංස්ථා සහ සංයුක්ත මණ්ඩල .. | (2,056) | (30,690) | (32,692) | (34,536) | (2,056) | (3) | (9,725) | (11) | (10,561) | (12) | (10,677) | (12) | 8·6 | 1·1 |
| 2·2·3 පෞද්ගලික අංශය .. | (3,388) | | | | (3,388) | (6) | | | | | | | | |
| 2·3 තොග වෙනස්වීම් .. | 33 | 225 | 137 | 148 | 33 | — | 63 | — | 38 | — | 37 | — | — | — |
| 2·4 භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන | 14,835 | 42,237 | 42,568 | 49,559 | 14,835 | 25 | 18,967 | 22 | 21,428 | 24 | 21,520 | 24 | 13·0 | 0·4 |

* තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

පවත්නා වෙළෙඳ මිළ අනුව දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය 1987 දී සියයට 8 කින් වැඩි වී ඇතැයි සටහන් වී ඇත. ප්‍රාග්ධන භාණ්ඩවල මි. ර. ගැ. වටිනාකම (ගොඩනැගිලි ද්‍රව්‍ය හැර) 1986 දී සියයට 2 වැඩිවීම හා සැසඳීමේදී 1987 දී සියයට 10 කින් ඉහළ නැඟ ඇත. ඒ අනුව දළ ජාතික ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ ආනයනික ප්‍රමාණය ආන්තික වශයෙන් වැඩිවී ඇති බව දක්නට ලැබුණි. ප්‍රාග්ධන සම්පාදනයේ විශාලතම දායකවීම සිදු වූයේ ගොඩනැගිලි හා ඉදිකිරීම් කටයුතු තුළින්ය.

1987 දී යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරණ සහ අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩ සඳහා වූ ප්‍රාග්ධන සම්පාදනය පවත්නා මිළ අනුව සියයට 5 කින් වැඩිවී ඇති අතර, ප්‍රවාහන උපකරණ සියයට 2 කින් ඉහළ ගොස් ඇත. ප්‍රධාන වශයෙන්ම නියඟය හේතුකොට ගෙන නැවත වගා කිරීමද ඇතුළත්ව, ඉඩම් සංවර්ධන කටයුතු සියයට 14.3 කින් පහත බැස ඇත.

**සම්පත් හා සම්පත් උපයෝජනය**

1987 ශ්‍රී ලංකා ආර්ථිකයෙහි පැවැති මුළු සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 266,946 ක් විය. එම සම්පත් ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 196,723 (සියයට 73.7) ක් දේශීය මූලයන්ගෙන්ද රුපියල් දශ ලක්ෂ 70,223 (සියයට 26.3) ක් ආනයන මගින්ද ලබාගෙන ඇත. මුළු සම්පත් ප්‍රමාණයෙන් සියයට 64.2 ක් පරිභෝජනය සඳහා වැය වූ අතර, සියයට 17.2 ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහා ද, සියයට 18.6 ක් අපනයන භාණ්ඩ හා සාධක නොවන සේවා සඳහා ද වැයවී ඇත.

1978 ස්ථාවර මිළ ගණන් අනුව මුළු සම්පත් ප්‍රමාණයේ වටිනාකම 1987 දී සියයට 0.5 කින් වැඩිවී ඇත. පෙර වසරට වඩා 1987 දී සියයට 1.9 කින් ආනයනික භාණ්ඩ හා සාධක නොවන සේවා පහත වැටී ඇත. ස්ථාවර මිළ ගණන් අනුව පරිභෝජන වියදම සියයට 0.8 කින් වැඩි වී ඇති අතර, ප්‍රාග්ධන සම්පාදනය සියයට 0.4 කින් පහත වැටී ඇත.

**1 . 9 සංඛ්‍යා සටහන**

**ජාතික ඉතුරුම් 1985 – 1987**
**(පවත්නා වෙළෙඳ මිළ අනුව)**

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1985 | 1986* | 1987* |
|---|---|---|---|
| 1. වෙළෙඳ මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතය .. | 162,375 | 179,474 | 196,723 |
| 2. දේශීය ඉතුරුම් .. | 19,273 | 21,624 | 25,235 |
| 3. විදේශීය ශුද්ධ සාධක ආදායම .. | - 3,400 | - 3,861 | - 4,336 |
| 4. විදේශීය ශුද්ධ පෞද්ගලික පැවරුම් .. | 7,212 | 8,251 | 9,161 |
| 5. ජාතික ඉතුරුම් .. | 23,085 | 26,014 | 30,060 |
| 6. දේශීය ඉතුරුම් අනුපාතිකය (අංක 2 අංක හි 1 ප්‍රතිශතයක් ලෙස) .. | 11·9 | 12·0 | 12·8 |
| 7. ජාතික ඉතුරුම් අනුපාතිකය (අංක 5 අංක 1 හි ප්‍රතිශතයක් ලෙස) .. | 14·2 | 14·5 | 15·3 |

* තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1986 දී දේශීය ඉතිරි කිරීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 21,624 ක් වූ අතර 1987 දී එය දශ ලක්ෂ 25,235 දක්වා වැඩි වී ඇත. වෙළෙඳ මිළ යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත්කල, දේශීය ඉතිරි කිරීම 1986 දී සියයට 12 ක් වූ අතර එය 1987 දී සියයට 12.8 ක් දක්වා ආන්තික වශයෙන් වැඩි වී ඇති බව පෙනේ. 1987 දී විදේශීය ශුද්ධ සාධක ආදායම සහ පෞද්ගලික සංක්‍රාමද අඩංගුවන මුළු ජාතික ඉතිරි කිරීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 30,060 ක් බව ඇස්තමේන්තු කර ඇත. ජාතික ඉතිරි කිරීම අනුපාතය 1986 දී සියයට 14.5 සිට 1987 දී සියයට 15.3 දක්වා වැඩි වී ඇත.